පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 490

ආයතනයේ නම : කොළඹ මහා නගර සභාව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் - 490

நிறுவனத்தின் பெயர் - கொழும்பு மாநகர சபை

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புகளும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Parlimentary Series No: 490

Name of the Institution : Colombo Municipal Council

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No 119(4)

රාජ්‍ය ගිණුම් කාරක සභාව - පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 490

කොළඹ මහා නගර සභාව

	කාරණය	මෙම අමුණා ඇති වාර්තාවට අනුව හඳුනාගනු ලැබූ දුර්වලතා	එම දුර්වලතා මහහරවා ගැනීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග/ එම ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් වන වර්තමාන ප්‍රගතිය
01	නිහ වරිපනම් බදු ආදායම් අය කරගැනීම	2025.02.25 1. දේපළ සමීක්ෂණ කටයුතු සඳහා සේවකයින් බඳවා ගැනීමට අවශ්‍ය කරන පහසුකම් සලසා දීමට කටයුතු කරන ලෙස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත කාරක සභාව උපදෙස් දුන්නේය. 2. කාල විශ්ලේෂණයක් අනුව දීර්ඝ කාලයක සිට පැවත එන නිහ මුදල් ප්‍රමාණ අයකර ගැනීමේ සැලැස්මක් සකස් කරන ලෙසත්, 3. මේ වන විට දේපළ හඳුනා ගැනීම සිදු කර ඇති බවට සඳහන් කළ කොළඹ කොටුව ප්‍රදේශයේ නිහ ආදායම් අය කරගැනීමේ කටයුතු මාස 6ක් ඇතුලත අවසන් කරන ලෙසත්, 4. අනෙකුත් ප්‍රදේශවලට අදාළව දේපළ සමීක්ෂණයේ කටයුතු නිශ්චිත කාලරාමුවක් ඇතුලත අවසන් කරන ලෙසත්, 5. දැනට එක් රැස් කර ඇති සමස්ත දත්ත පිළිබඳ	1. 2. 2024.12.31 නිහය අයකරගැනීමේ සැලැස්ම අමුණා ඇත. (ඇමුණුම 01) 3. කොළඹ කොටුව ප්‍රදේශයේ 2024.12.31 දිනට රු. 100,000/ට වැඩි නිහ සහිත දේපළ 840 කින් නිහ අයකර ගැනීම මාස 06 කින් ක්‍රියාත්මක කර නිවේදන බෙදා නිහ අයකර ගනිමින් දේපළ හඳුනා ගැනීම සිදුකළ අතර ඉන් දේපළ 83ක් සොයාගත නොහැකි වූ අතර දේපළ තහනම් කිරීමේ නිවේදන ලබාදීමේදී ගැටළු පවතින දේපළ 146ක් වාර්තා කර ඇති අතර දේපළ 221ක් රජයේ දේපළ බවට වාර්තා වූ අතර දේපළ 203කට සත් දින නිවේදන නිකුත් කරන ලදී. එයින් තව දුටත් නිහ නොගෙවූ දේපළ 94ක් පවරා ගැනීම සඳහා පුවත් පත් දැන්වීම් පළ කිරීමට යොමු කර ඇත. (ඇමුණුම 02) රු. 100,00/ට අඩු නිහ සහිත දේපළ 2453 කට ඉල්ලීම් නිවේදන ලබාදී සොයා ගත නොහැකි දේපළ 37ක් වාර්තා කර ඇති අතර නිහ දේපළ 1672 කට දේපළ තහනම් කිරීමේ නිවේදන භාර දී ඇත. (ඇමුණුම 03) 4. කොළඹ නගරයේ නාගරික කොට්ඨාශ 47හි රු.100,000/ට වැඩි නිහ සහිත දේපළ 5525කට ඉල්ලීම් නිවේදන, දේපළ

		වාර්තාවක් (දේපලේ නම්, හිමිකරුවන්ගේ නම් සහ වසරින් වසර හිඟ බදු ප්‍රමාණයන් ඇතුළත්ව) සහ හිඟ ආදායම් පවතින දේපළ පිළිබඳ සමීක්ෂණයේ මාර්ග සැලැස්ම සතියක් තුළ (2025.03.04 දිනට පෙර) කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත් කාරක සභාව නිර්දේශ කළ අතර, ප්‍ර. ග. නි./ ග.නි. ඒ සමඟ එකඟ විය. **2025.10.08** **1. KOICA ආයතනය සමඟ සකස් කරනු ලබන දත්ත පද්ධතිය හරහා වරිපනම් ආදායම් එකතුකර ගැනීමේ කාර්යය සාධනය වර්ධනය කර ගැනීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් සකසා ගැනීමත්,** **2. කොළඹ මහා නගර සභාවේ අනෙකුත් ආදායම් ශීර්ෂ 78 සඳහා ද ආදායම් එකතු කිරීම සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම පිළිබඳ සලකා බැලීමට පත් කර ඇති ස්ථාවර කමිටුව හරහා එම ආදායම් ශීර්ෂවල	3673 කට දේපළ තහනම් කිරීමේ නිවේදන ලබාදී පවරා ගැනීමට නියමිත දේපළ 1602ක් පුවත් පත් දැන්වීම් පළ කිරීමට යොමු කිරීමේ කටයුතු සිදුකරමින් (ඇමුණුම 04) හිඟ මුදල් අය කරන අතර එක් එක් දේපළ හඳුනාගනිමින් සිදු කරන ලද සමීක්ෂණයෙන් රු.100,000/ට වැඩි හිඟ සහිත දේපළ 481ක් සොයාගත නොහැකි දේපළ ලෙස හඳුනාගන්නා ලද අතර රු.100,000/ට අඩු හිඟ සහිත දේපළ 52237 කට ඉල්ලීම් නිවේදන, දේපළ 9058 කට දේපළ තහනම් කිරීමේ නිවේදන ලබාදී 3228ක් සොයාගත නොහැකි දේපළ ලෙස හඳුනාගෙන නාගරික තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. (ඇමුණුම 05) **5.** ලේඛනගත වරිපනම් දේපළ භෞතිකව තිබේද නැද්ද යන්න පිළිබඳව ඉල්ලීම් නිවේදන බෙදා හැරීමත් සමඟ සමීක්ෂණයට ලක්කළ අතර, ඊට අදාල ප්‍රගතිය ඉහත අංක 4 මඟින් ඉදිරිපත් කර ඇත. 1. KOICA ආයතනය හා කොළඹ මහා නගර සභාව 2025 දී අත්සන් කරන ලද ගිවිසුම් ප්‍රාකාරව කොළඹ මහා නගර සභාව තුල Establishment of IT master Plan on Tax Administration and Implementation of e-Tax System for Colombo Municipal Council Sri Lanka වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කොරියන් රජයේ ප්‍රධානයක් ලබා දීම සඳහා කොරියානු රජය මඟින් ප්‍රසම්පාදන කටයුතු ඉටු කර අදාළ මෘදුකාංගය සංවර්ධනය කිරීම සඳහා මූලික සැලැස්මක් එම ආයතනය මඟින් 2026 ජනවාරි 05 වන දින ලබා දී ඇත.(ඇමුණුම 06) එම සැලැස්මට අනුව දැනට පවතින MCAS තොරතුරු පද්ධතියේ පවතින අඩුපාඩු නිවැරදි කර ගැනීමට සැලැසුම් කර තිබෙන අතර එහි දී මහජනතාව වෙත ඕනෑම මාධ්‍යකින් Online මඟින් කොළඹ මහා නගර සභාව සමඟ ගනුදෙනු කිරීමේ පහසුකම් වැඩි දියුණු කිරීමට අපේක්ෂා කරන අතර

		වැදගත්කම අනුව ප්‍රමුඛතාවය ලබාදෙමින් එකතු කිරීමේ විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමත්, **3. හඳුනාගත නොහැකි දේපළ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම සඳහා අදාළ ස්ථාවර කමිටුව හරහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීමත්,** **යන කරුණු සම්බන්ධයෙන් වන ප්‍රගතිය වාර්තා කිරීමේ හැකියාව පිළිබඳව කාරක සභාව විමසූ අතර, මාස 03ක් ඇතුළත (2026.01.08 දිනට පෙර) මේ සම්බන්ධ අතුරු වාර්තාවක් සහ මාස 06ක් තුළ (2026.04.08 දිනට පෙර) එහි අවසන් වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට ග.නි. කාරක සභාව හා එකඟ විය.**	එය මඟින් වර්තමානයේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තාක්ෂණික දුර්වලතා මඟ හරවා ගනිමින් ආදායම් එකතු කර ගැනීමේ කාර්ය සාධනය වර්ධනය කර ගැනීමට අපේක්ෂා කෙරේ. 2. මේ සම්බන්ධයෙන් මේ වනවිට අදායම් උත්පාදනය හා සංවර්ධනය පිළිබඳ කමිටුවේ සභාපති විසින් ඩිජිටල්කරණය මඟින් ආදායම් උත්පාදනය කිරීම පිළිබඳ යෝජනාවක් ඉදිරිපත් වී ඒ පිළිබඳ ආදායම් කමිටුව තුල සාකච්ඡා කර ඇති අතර එය ඉදිරියට ක්‍රියාත්මක කිරීමට අදාල මූලික අදියරයන් ක්‍රියාත්මක කරමින් පවතින අතර ඒ පිළිබඳ මූලික යෝජනාව මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව වෙත යොමුකර සභා සම්මුතීන් ලබා ගැනීමට අපේක්ෂිතය. 3. සමීක්ෂණය මඟින් හඳුනාගත නොහැකි දේපළ දෙවන අදියරේදී 2209 ක් විය. හඳුනාගත නොහැකි දේපළ පිළිබඳ තවදුරටත් එහි නිවැරදිභාවය පිළිබඳ නාගරික තක්සේරු දෙපාර්තමේන්තුව හා නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුව එක්ව ක්‍රියාකරමින් නිරවුල් කර ගැනීමට අපේක්ෂිතය.(ඇමුණුම 07)
02	**මහ නගර සභාව සතු ඉඩම් 168 සම්බන්ධ ගැටලු**	හඳුනාගත් ඉඩම්වල මැනුම් කටයුතු අවසන් කර නිරවුල් කර ගැනීමට අදාළ වන ක්‍රියාපිළිවෙල සඳහා කාල රාමුවත් සකස් කර සතියක් තුළ (2025.03.04 දිනට පෙර) කාරක සභාව නීර්දේශ කළ අතර, ප්‍ර.ග.නි./ග.නි. ඒ සඳහා එකඟ විය.	විගණන විමසුම් හා විගණන වාර්තා මඟින් කොළඹ මහා නගර සභාව සතුව ඉඩම් 168 පවතින බවට කරුණු වාර්තා කළද, ඒකී ඉඩම් 168 න් සත්‍ය වශයෙන්ම කොළඹ මහා නගර සභාව සතු බවට ලේඛන අනුව හඳුනාගත් ඉඩම් සංඛ්‍යාව 132 කි. එම සියල්ල මැනුම් කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. 2026 මැයි මස අවසානයට ඉඩම් 75ක් මැනුම් කර අවසන් කර ඇති අතර, ඒ අනුව ඉඩම් ලේඛනය යථාවත් කරන ලදී. ඒසේම එම පිඹුරු තක්සේරු වටිනාකම් ලබා ගැනීම සඳහා නාගරික තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදුව, තක්සේරු කරනු ලැබූ ඉඩම් 40ක තොරතුරු ඇතුළත් කර ඉඩම් අංශයේ ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කරන ලදී. එම තොරතුරු ගිණුම් ගත කිරීම සඳහා මධ්‍යම ගිණුම් අංශයටද යොමු කරනු ලැබිනි.

			ඉතිරි ඉඩම් 57හි ද මැනුම් කටයුතු සිදුකරගෙන යමින් පවතින අතර, ඉඩම් මැනුම් කර පිඹුරු ලැබෙන අනුපිළිවෙල අනුව ඉඩම් ලේඛනය යාවත්කාලීන කිරීම, තක්සේරු වටිනාකම් ලබා ගැනීම, එම තොරතුරු මධ්‍යම ගිණුම් අංශයට යොමු කිරීම සහ ඉඩම් අංශයේ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම අඛණ්ඩව සිදු කෙරේ. මැනුම් කටයුතු 2025 වසර තුළ අවසන් කිරීමට සැලසුම් කර තිබුනද, 2025 සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මස අවසානය දක්වා මිනින්දෝරු කාර්ය මණ්ඩලය පුරප්පාඩු වීම සහ රටේ පැවති අයහපත් කාලගුණික තත්වය නිසා මැනුම් කටයුතු සිදු කිරීමට නොහැකි විය. එබැවින්, එම කාර්යය නිම කිරීම සඳහා 2026 වසරේ දෙසැම්බර් දක්වා කාලය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.
03	මෝදර එලිහවුස් ඉඩම	<u>2025.02.25</u> 1) මෙම ඉඩම තුළ අනවසරයෙන් භුක්ති විඳින දේපළ සම්බන්ධව ඉදිරිපත් කර ඇති අභියාචනය පිළිබඳව ගරු ආණ්ඩුකාරතුමා සමඟ පැවැත්වීමට නියමිත සාකච්ඡාවෙන් අනතුරුව, එම දේපළ කොළඹ මහා නගර සභාව වෙත පවරා ගැනීම පිළිබඳව එකඟතාවයකට පැමිණ ඒ සම්බන්ධව කාරක සභාව දැනුවත් කරන ලෙසත්, 2) එම ක්‍රියාවලිය අතරතුර, මහා නගර සභාවට අයත් භූමියක් අනවසරයෙන් භුක්ති විඳීමට අදාළව කොළඹ මහා නගර සභාවට අයවිය යුතු දඩ මුදල ලබාගැනීම සඳහා මාසයක් ඇතුලත අවශ්‍ය කටයුතු	කොළඹ මහා නගර සභාව සතු (කොළඹ 15 අළුත් මාවත 521/ 5ඒ දරණ ස්ථානයේ පිහිටි (මෝදර එලී හවුස් ඉඩම) සැමට සරණ ආයතනය වෙත බදු පදනම මත ලබා දී තිබූ අතර 2022.07.29 දිනෙන් ගිවිසුම් කාලය අවසන් වූ දේපළ නැවත ලබා දීමටත්, අවසරයකින් තොරව එම ආයතනය විසින් 1992 වර්ෂයේ සිට භාවිත කල පර්චස් 40 ක බිම් කොටස් සඳහා දඩ පොලියක් අය කිරීමටත් , ඉතිරි බිම් කොටසේ (පර්චස් 50 ක) කොටස් පිළබඳව තීරණයක් ගැනීම සඳහා වන කොළඹ මහා නගර සභාවේ කෙටුම්පත් අංක 108 යටතේ මුදල් පිළිබඳ ස්ථාවර කාරක සභාවේ නිර්දේශය මහා සභාවේ අනුමැතිය අපේක්ෂාවෙන් නාගරික භාණ්ඩාගාරික විසින් නාගරික කෙමසාරිස් හා ගරු නගරාධිපති විසින් මුදල් පිළිබඳ ස්ථාවර කාරක සභාව වෙත 2026.03.04 වන දින යොමු කර නිර්දේශ ලබා ගෙන 2026.04.09 වන දින මහා සභාව මගින් , අංක 022 දරණ පිඹුරේ රූඩ් 2 පර්චස්

		සිදු කරන ලෙසත්, කාරක සභාව නීර්දේශ කළ අතර, ප්‍ර.ග.නි/ ග.නි. ඒ සඳහා එකඟ විය. 2025.10.08 අදාළ බදුකරුගෙන් දඩ පොලිය අයකර ගැනීම සඳහා කොළඹ මහා නගර සභාවේ මුදල් කාරක සභාවේ සහ මහා සභාවේ සහ මහා සභාවේ අනුමැතියට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, ඒ සම්බන්ධ ගනු ලබන තීරණය සහ ඒ අනුව ඉදිරි කටයුතු සිදුකිරීම සම්බන්ධයෙන් වන ප්‍රගතිය පිළිබඳව පිළිබඳව (2025.12.31 දිනට පෙර) කාරක සභාව වෙත වාර්තා කිරීමට ග.නි. කාරක සභාව හා එකඟ විය.	8.66 ක භූමි ප්‍රමාණය බදු පදනම මත 2022.07.30 වන දින සිට වසර 05 ක බදු ලබා දීමටත්. අනවසරයෙන් බුක්ති විඳි ට්‍රෙසින් අංක 2025/05 අනු රේඛාවේ ලොට් අංක 04 දරණ භූමි ප්‍රමාණයේ භුක්තිය පවරා ගනිමින් ආරක්ෂක වැටක් ඉදි කිරීමටත්, අනවසරයෙන් 1992 වර්ශයේ සිට භුක්ති විඳින ලද පර්චස් 40 කොටස් සඳහා 2026.03.31 දක්වා රු.4,667,264.00 ක දඩ පොලියක් අය කර එම කොටසද වසර 5 ක කාල සීමාවක් සඳහා බදු දීමට අනුමැතිය ලබා දී ඇත . ඒ අනුව 2026.04.07 දින අදාල හිඟ මුදල් ගෙවා ඇති අතර විධිමත් ගිවිසුමක් මගින් වසර 05 කාල සීමාවක් සඳහා කොළඹ මහා නගර සභාව සතු මොදර එලි හවුස් ඉඩමින් පර්චස් 90 ක බිම් කොටසක් සැමට සරණ පුණ්‍ය ආයතනය වෙත බදු ලබා දීම සඳහා ගරු බස්නාහිර පළාත් ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය ලබාගෙන ගිවිසුම් ගත වීමට අපේක්ෂිතය. එමෙන්ම නාගරික කර්මාන්ත ශාලාව වෙත සැමට සරණ ආයතනය විසින් අනවසරයෙන් බුක්ති විඳින ලද පර් 50 ක ඉඩම් කොටස් කොළඹ මහා නගර සභාවේ ඉඩම් හා පරිසර ඒකකය වෙත ආරක්ෂිත වැටක් ඉදිකර පවරා ගැනීමට කටයුතු කරන ලෙස දන්වා ඇත.
04	**බොරැල්ල සුසාන භූමි පාලකගේ නිල නිවාසය හා ඉඩම අවභාවිතා කිරීම.**	2025.02.25 1) මෙම කරුණට අදාළව විධිමත් විනය පරීක්ෂණයක් සිදු කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ විනය පරීක්ෂණ නිලධාරී	රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියෝගය පරිදි බොරැල්ල සුසාන භූමි නිල නිවාසය හා ඉඩම අවභාවිතා කරමින් සුප්‍රීම් මල් ශාලාව නමින් ව්‍යාපාරයක් පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් (බ.ප.) මඟින් සිදු කරන ලද පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ, • අංක 07.2 අනුව ඇල්විටිගල මාවත, කොළඹ 08 ලිපිනයේ පවතින සුප්‍රීම් මල් ශාලාව යන ව්‍යාපාරය පවත්වාගෙන යන දේපළ අවභාවිතා කිරීම/ අවභාවිතා වීමට ඉඩ හැරීම සම්බන්ධයෙන්

		සංචිතයෙන් අවශ්‍ය නිලධාරීන් ලබා දීමට කටයුතු කරන ලෙස කාරක සභාව කළ නීර්දේශය සහ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් එකඟ විය. 2) මෙම කරුණට අදාළව සම්පූර්ණ පරීක්ෂණයක් සිදුකිරීම සඳහා කමිටුවක් පත් කර එහි පරීක්ෂණ වාර්තාව සති දෙකක් තුළ (2025.03.11 දිනට පෙර) කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව කළ නීර්දේශය සමඟ බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් එකඟ විය. <u>2025/02/27</u> අදාළ සේවකයාට එරෙහිව විධිමත් විනය පරීක්ෂණයක් සිදු කර නොමැති බැවින්, එවකට සිටි නාගරික කොමසාරිස්වරිය ඇතුළු පරිපාලනමය	වගකිව යුතු පුද්ගලයන් හඳුනා ගැනීම හා ඒ තුළින් කොළඹ මහා නගර සභාවට සිදු වී ඇති හානිය පාඩුව තීරණය කිරීම සඳහා ඒ සම්බන්ධයෙන් මු.රෙ.104 පරීක්ෂණයක් සිදු කර පූර්ණ වාර්තාවක් ලබා දීම සඳහා මු.රෙ. 104 කමිටුවක් 2026.02.03 දිනැතිව පත් කර ඇති බව දන්වා ඇත. • ඒ අනුව උක්ත මු.රෙ. 104 කමිටුව විසින් වාර්තාව ලබා දී ඇත. ඒ සඳහා ඊට අදාලව නාගරික කොමසාරිස් විසින් ලබා දී ඇති නියෝග ප්‍රකාරව 2021.04.07 දිනැති සභා තීරණ අංක 2336 අනුව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීති නිලධාරී වෙත දන්වා ඇති බවත්, ඊට අදාලව තක්සේරු නිලධාරීන් මඟින් මෙම අයකර ගත යුතු මුදල ගණනය කර ඇති ආකාරය සම්බන්ධ වාර්තාවක් ලබා ගැනීමට නාගරික තක්සේරුකරු වෙත යොමු කිරීමට කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වමි. • අංක 07.3 සම්බන්ධයෙන් මේ වන විට ඉහත 02 හි සඳහන් පරිදි විනය ක්‍රියාමාර්ග ගෙන ඇත. • අංක 07.5 හා 07.6 සම්බන්ධව හිටපු නාගරික කොමසාරිස් හදානි ජයවර්ධන මහත්මිය සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කල ද, හිටපු ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් වන වෛද්‍ය ප්‍රදීප් කාරියවසම් මහතා හා වෛද්‍ය රුවන් විජයමුණි මහතා යන නිලධාරීන් දෙදෙනා මෙන්ම ඇයව ද විධිමත් ලෙස විශ්‍රාම ගන්වා ඇති බැවින් (2.17 වගන්තිය යටතේ) ඇයට එරෙහිවද විනය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාවක් නොමැති බැවින් ඉහත සඳහන් කරන ලද මු.රෙ.104 පරීක්ෂණයෙන් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත. 02. එහි ගිණුම් කාරක සභාව විසින් ලබා දී ඇති නිර්දේශ අනුව ප්‍රශ්නගත සේවකයා සම්බන්ධයෙන් පහත පරිදි විනය කටයුතු සිදු කර ඇති බව දන්වමි. A. සුසාන භූමි පාලක වෙත නිකුත් කර තිබූ සේවය අතහැරයාමේ නිවේදනය අවලංගු කර රාජකාරි වැඩ තහනම් කර ඇති අතර, ව්‍යාජ කුවිතාන්සියක් නිකුත් කිරීම සම්බන්ධව සුසාන භූමි පාලක (විශේෂ ශ්‍රේණිය), ජී.ඒ.සී.කේ.පෙරේරා මයා වෙත නිකුත් කර තිබූ

		වගකීම දරන ලද අනෙකුත් නිලධාරීන් විසින් මෙම කරුණ සම්බන්ධව නිවැරදි ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන්න හා මෙම කරුණ සම්බන්ධව එම නිලධාරීන් විසින් චේතනාන්විතව යම් අත්හැරීම් හෝ වැරදි සිදු කර තිබේද යන්නත්, එසේ නම් ඒ සම්බන්ධව එම නිලධාරීන්ට එරෙහිව ගත යුතු ක්‍රියාමාර්ග කවරේද, යන කරුණු පිළිබඳව 2025.02.25 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දී බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් විසින් ඉදිරිපත් කිරීමට එකඟ වූ පරීක්ෂණ වාර්තාව මඟින් අවධානය යොමු කළ යුතු බවට කාරක සභාව උපදෙස් දුන්නේය. 2) මෙම කරුණට අදාළ වන සුසාන භූමි පාලක සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ගයක් ගෙන ඒ පිළිබඳ වාර්තාවක් සතියක් තුළ (2025.03.04 දිනට පෙර) ලබා දෙන ලෙසත්, 3) ප්‍රශ්නගත මල් ශාලාව අනීතික ව්‍යාපාරයක් බවට තහවුරු වී ඇති බැවින් පවතින නීතිරීතිවලට අනුව එම ව්‍යාපාරය තහනම් කිරීමට අදාළ ක්‍රියාමාර්ග 2025.02.28 දිනම ආරම්භ කරන ලෙසත්, කාරක සභාව නිර්දේශ කළ අතර කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් ඒ සඳහා එකඟ විය. 4) හිටපු නාගරික කොමසාරිස්, ආචාර්ය රෝෂනී දිසානායක මහත්මිය විසින් කාරක සභාවේ විමර්ශන කටයුතු සඳහා ලබාදුන් සහයෝගය අගය කළ කාරක සභාව, එම නිලධාරිනිය වෙත ප්‍රශංසා ලිපියක් ලබා දීමට කටයුතු කරන ලෙස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ	වෝදනා පත්‍රයට අදාලව විධිමත් විනය පරීක්ෂණය මේ වන විට පැවැත්වෙන අතර එහි සැසි 14ක් මේ වන විට පවත්වා අවසන්ව ඇති බව දන්වමි. B. බොරැල්ල සුසාන භූමි පාලකගේ නිල නිවාසය හා ඉඩම අවභාවිතා කිරීම පිළිබඳව සිදු කරන ලද මූලික විමර්ශනයේ නිර්දේශ අතර , සුසාන භූමි පාලක වෙත 2025.10.03 දිනැතිව වෝදනා පත්‍රයක් නිකුත් කර ඇති අතර එම වෝදනා පත්‍රය සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් සඳහා ඒක පුද්ගල විනිශ්චය සභාවක් පත් කර විධිමත් විනය පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. C. එමෙන්ම බොරැල්ල සුසාන භූමියේ බදු දී ඇති මිනීවලවල් හා භෂ්මාවශේෂ තැන්පත් කිරීමට අවසර දී ඇති ස්ථාන පිළිබඳ සිතියම් හා ලේඛන විනාශ වීම/ අස්ථානගත වීම හා සුසාන භූමිය අවභාවිතා වීමට ඉඩ හැර තිබීම සම්බන්ධයෙන් සිදු කරන ලද මූලික විමර්ශනයේ නිර්දේශ අනුව ඉදිරිපත් කර ඇති වෝදනා පත්‍රය සුසාන භූමි පාලක (විශේෂ ශ්‍රේණිය), ජී.ඒ.සී.කේ.පෙරේරා මයා වෙත 2026.03.19 දින යොමු කර ඇති අතර, අදාල වෝදනා පත්‍රය අනුව මේ වන විට ඉදිරි විනය කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. 03. බොරැල්ල සුසාන භූමි පාලකගේ නිල නිවාසය හා ඉඩම අවභාවිතා කිරීම සම්බන්ධයෙන් Suprim Funeral Directors (Pvt) Ltd ආයතනය විත්තිය කරමින් මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 12970/25 යටතේ නඩු පවරා ඇති අතර, එම නඩුව 2025.05.09 වන දින කැඳවා ඇති අතර, විත්තිකාර පාර්ශවය නියෝජනය නොවීය. මෙම නඩු 2025.06.30 නැවත කැඳවන ලද අතර 2025.08.22 වන දිනට වරෙන්තු කැඳවන ලදී. එහිදී 2025.12.15 වන දින පැවති නඩුවට ඉදිරිපත්වී නිවැරදිකරු ලෙසට ප්‍රකාශ කරන ලදී. නැවත 2026.03.20 වන දින නඩුව කැඳවන ලද නමුත්, එදින විරෝධතා ගොනු නොකිරීම නිසා 2026.05.11 දින කැඳවා විරෝධතා ගොනු කිරීමට නියමිතව තිබූ නමුත්, ඒදිනද විරෝධතා ගොනුකර නොමැති වීමෙන්. නැවත එම නඩුව 2026.07.27 දිනට මූලික විරෝධතා ගොනු කිරීමට දින ලබා දෙන ලදී.

		පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත නිර්දේශ කළේය. **විමර්ශනය කරන ලද දිනය - 2025.10.08** 1) තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් සමඟ සාකච්ඡා කර ප්‍රශ්නගත දේපළ කොළඹ මහ නගර සභාවට පවරා ගැනීමේ ක්‍රියාමාර්ගය කඩිනමින් සිදුකිරීමට අවශ්‍ය කටයුතු කිරීමට ගකාරක සභාව හා .නි. .එකඟ විය 2) කොළඹ මහ නගර සභාව කාරක සභාව වෙත ඉදිරියේදී කැඳවනු ලබන අවස්ථාවකදී මෙම කාර්යයේ ප්‍රගතිය සමාලෝචනයට තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කැඳවීමට කාරක සභාව විසින් තීරණය කරන ලදී.	බොරැල්ල සුසාන භූමි පාලකගේ නිල නිවස පිහිටි ඉඩම කොළඹ මහ නගර සභාවට පවරා ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග • සර්වේයර් ජනරාල් විසින් 1944.12.14 නිකුත් කර ඇති අංක A 1790 දරණ මූලික පිඹුරේ කැබලි අංක 02 රජයේ ඉඩමක් ලෙස පවතින බව නිරීක්ෂණය වන බැවින්, හා එම ඉඩම් කොටස් තුළ බොරැල්ල සුසාන භූමි පාලකගේ නිල නිවස පිහිටා ඇති බැවින්, එම ඉඩම් කොටස කොළඹ මහා නගර සභාවට පවරා දෙන මෙන් නාගරික කොමසාරිස් විසින් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් වෙතින් අංක: ME/L/15/2020 මගින් ඉල්ලීමක් කර ඇත. (ඇමුණුම 08) • එසේම නාගරික කොමසාරිස්ගේ 2014.08.29 දිනැති ඉල්ලීම මත මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් 2016.09.30 දිනැතිව අංක CO/DSO/2014/814 දරණ පැහැදිලි කිරීමේ අනුරේඛණය සකසා ඇත. එම පැහැදිලි කිරීමේ අනුරේඛණයේ කැබලි අංක 61 සුප්‍රීම් මල් ශාලාව පිහිටා ඇති බිම් කොටස වන අතර, එහි විස්තර ප්‍රකාශයේ වෙනත් කරුණු යටතේ "A 1790 දරණ මූලික පිඹුරේ කැබලි අංක 2හි කොටසක් කනත්ත භාරකරුගේ නිල නිවස සහ බොරැල්ල සුප්‍රීම් මල් ශාලාව ඇත" යනුවෙන් සඳහන්ව ඇත. ඒ අනුව, සුප්‍රීම් මල් ශාලාව පිහිටා ඇති කොටස රජය සතු ඉඩම් කොටසට අයත් වේ. එබැවින්, එම ඉඩම් කොටස පවරා දෙන මෙන් නාගරික කොමසාරිස් විසින් 2023.01.12, 2023.05.20, 2024.06.13 දිනැතිව තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් වෙතින් ඉල්ලීම් කර ලිපි යවා ඇත. (ඇමුණුම් 09, 10) • එම ඉල්ලීම මත තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් විසින් සභාව වෙත ඉඩම පවරාදීම සඳහා පිඹුර සකසා ගැනීමට නිකුත් කරන ලද මැනුම් නියෝගය මත සර්වේයර් ජනරාල් විසින් 2024.08.11 දිනැති අංක 520614 දරණ කැඩැස්තර සිතියම සකසන ලදීදහන් රජයේ බිම් කොටසේ අනුවද උක්ත ස .ෙ විෂයගත ගොඩනැගිල්ල පිහිටා ඇති බව පෙන්නුම් කෙරේ.

			• එබැවින් එම ඉඩම් කොටස පවරා ගැනීමට අදාලව 2024.09.25 දින නාගරික කොමසාරිස් හා අදාල නිලධාරීන් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් සමඟ සාකච්ජාවක් පවත්වන ලදී. • නැවතත් නාගරික කොමසාරිස් විසින් සමාංක හා 2025.05.1, 2025.07.16 දිනැතිව සවිස්තරාත්මක තොරතුරු ද යොමු කරමින් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් වෙතින් ඉඩම පවරා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී (ඇමුණුම් 11,12) • එසේම නාගරික කොමසාරිස් විසින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් ඉඩම පවරාදීමේ කටයුතු කඩිනම් කර ගැනීම සඳහා 2025.08.12 දිනැතිව කරන ලද ඉල්ලීමට අනුව3 2025.09.2 දින ඉඩම් කොමසාරිස් ජනරාල් සමඟ ද අදාල පාර්ශවයන්ගේ සහභාගීකත්වයෙන් සාකච්ජාවක් පවත්වන ලදී. (ඇමුණුම 13) • 2025.09.23 දින ඉඩම කොමසාරිස් දෙපාර්තමේන්තුවේදී පැවති එම සාකච්ජාවේ දී ලද උපදෙස් පරිදි හා තිම්රිගස්යාය ප්‍රාදේශීය ලේකම්ගේ අංක ත්‍රිප්‍රාලේ /1/10/4/101 2025.10.22 දිනැති ලිපියේ ඉල්ලීම පරිදි ඉඩම ලියාපදිංචියට අදාල තොරතුරු හා පත්ඉරු වාර්තා කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබා ගෙන 2025.11.13 දින ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කරන ලදී (ඇමුණුම් 14,15) • ඒ අනුව ප්‍රාදේශීය ලේකම් විසින් අංක ත්‍රිප්‍රාලේ/1/10/4/101 හා 2025.12.15 දින එම ලේඛන ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කරමින්, ඉඩම පවරාදීම සම්බන්ධයෙන් ගතයුතු ඉදිරි පියවර විමසනු ලැබ ඇත (ඇමුණුම් 16) • එසේම, ඉඩම පවරාදීමට අවශ්‍ය කටයුතු කඩිනමින් ඉටුකර දෙන මෙන් 2026.01.14 දින නාගරික කොමසාරිස් විසින්

			ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් නැවතත් ඉල්ලා යවන ලදී. (ඇමුණුම 17) • ඉහත ඉල්ලීම අනුව විෂයගත ඉඩම් කොටස කොළඹ නගර සභාවට පවරා දීම සඳහා තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සමඟ අවශ්‍ය සියළු ලේඛණ බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් වෙත 2026.03.13 දින යොමු කර ඇත (ඇමුණුම 18) • බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් විසින් ද ඉඩම සභාවට පවරාදීම නිර්දේශ කරමින් අදාල ලේඛණ පළාත් සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා බස්නාහිර පළාත් කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වෙත PLC/L10/6/12/78 – 2026 හා 2026.03.27 දින යොමු කරනු ලැබ ඇත (ඇමුණුම 19) • ඉහත අනුව බොරැල්ල සුසාන භූමි පාලකගේ නිල නිවස පිහිටි ඉඩම් කොටස පවරාගැනීමේ කටයුතු බොහෝ දුරට අවසන් කරගැනීමට හැකි වූ බව කාරුණිකව වාර්තා කරමි.
05	බොරැල්ල සුසාන භූමියේ මළ සිරුරු භූමදානය කිරීමට බදු දී ඇති ස්ථාන සහ භෂ්මාවශේෂ තැම්පත් කිරීමට අවසර දී ඇති ස්ථාන	<u>විමර්ශනය කරන ලද දිනය - 2025.02.25</u> 1. බොරැල්ල සුසාන භූමිය තුල ස්මාරක ඉදිකිරීම සඳහා බිම් කොටස් පවරාදීමේදී නිකුත් කරන ලද ඔප්පු පිළිබඳ දැනට පවතින තොරතුරු ඇතුළත් වාර්තාවක් සතියක් තුල (2025.03.04 දිනට පෙර) කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව නිර්දේශ කළ අතර ප්‍ර.ග.නි./ග.නි. ඒ සඳහා එතඟ විය. <u>විමර්ශනය කරන ලද දිනය - 2025.10.08</u> 1. යෝජිත විසඳුමඑයට අදාළ වැඩපිළිවෙල ද ,	• බොරැල්ල සුසාන භූමියට අදාළව දැනට පවතින ලේඛන අනුව, මේ වන විට නිකුත් කර ඇති ප්‍රදානපත්‍ර තොරතුරු මත පරිගනක දත්ත පද්ධතිය සකස් කිරීම අවසන් කර ඇති අතර ඒ අනුව බොරැල්ල සුසාන භූමියට අදාළව ප්‍රධාන පත්‍ර 9528ක් නිකුත් කර ඇත. (ඇමුණුම 20) • එම ප්‍රදානපත්‍ර වල තොරතුරු වලට අනුව පැරණි සිතියම් වල පිටපත් නැවත අංකනය කිරීම සිදු කර අවසන් කර ඇත. (ඇමුණුම 21) • බොරැල්ල සුසාන භූමිය නැවත සිතියම් ගත කිරීම සඳහා නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව සහ මිනින්දෝරු දෙපාර්තමේන්තුව සමඟ එක්ව කටයුතු කළ අතර බොරැල්ල සුසාන භූමියෙහි සම්පූර්ණ පිඹුර සහ කොළඹ මහා නගර සභාව යටතේ පවත්වාගෙන යනු ලබන බිම් කොටස් ප්‍රමාණය සම්පූර්ණයෙන් මැන අවසන් කර මිනින්දෝරු වාර්තාව ලබා දී ඇත. ඒ අනුව දැනට ඉදිකර ඇති

		1 ගතිය මාසසමඟ වන ප්‍ර½ක් තුළ 2025.11.22)දිනට පෙර(කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට කාරක සභාව නිර්දේශ කළ අතර ග.නි. ඒ සඳහා එකඟ විය.	සුසාන ස්මාරක ගණන 8515ක් බව දන්වා ඇත (ඇමුණුම 22) • අංකනය කරන ලද පැරණි සිතියම සහ නව මිනින්දෝරු සිතියම අනුව ස්මාරක සත්‍යාපනය කිරීම ආරම්භ කර ඇති බව ද එය අවසන් වූ වහාම අවසාන වාර්තාව ඉදිරිපත් කිරීමට අපේක්ෂිතය.
06	අපජල පොම්පාගාරය සහ අපජල පවිත්‍රාගාරය	<u>විමර්ශනය කරන ලද දිනය - 2025.02.25</u> 1) අපජල පිරිපහදු කිරීමෙන් තොරව ගැඹුරු මුහුදට මුදාහැරීම නතර කොට සුදුසු සැලසුම් සකස් කළ යුතු බව,	අපජලය ගැඹුරු මුහුදට මුදා හැරීම පිළිගත් ක්‍රමවේදයකි. එමගින් පරිසරයට සිදුවන හානිය, අපජල පද්ධතියේ බිඳවැටීම් නිසාත් පූතික ටැංකි භාවිතය නිසාත්, අක්‍රමවත් ලෙස ජලමූලාශ්‍රවලට අපජලය මුදා හැරීම නිසාත් සිදුවන හානියට වඩා අඩුය. ජලාපවහන අංශය වෙත ලැබෙන / තිබෙන ප්‍රතිපාදන වැඩි පාරිසරික හානියක් විය හැකි දේ නැවැත්වීම සඳහා ප්‍රමුඛතාවක් ලබා දෙමින් කටයුතු කරයි. අපජල පවිත්‍රාගාරයක් ඉදි කිරීම මගින් අපජලය ගැඹුරු මුහුදට මුදා හැරීම මගින් සිදුවිය හැකි පාරිසරික හානිය අවම කරගත හැකිය.
		2) පළාත් පාලන මැතිවරණයෙන් පසුව මහා සභාව නැවත තෝරා පත් කරගත් පසුව වැල්ලවත්ත අපජල පවිත්‍රාගාර ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව සොයා බැලිය යුතු බවට කාරක සභාව විසින් තීරණය කරන ලදී.	මේ වන විට වැල්ලවත්ත අපජල පවිත්‍රාගාර ව්‍යාපෘතිය ඇතුළු ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට අදාළ අනුමැතිය ලබාගැනීම සඳහා යොමු කර ඇත. අපජල පවිත්‍රාගාරය ඉදිකිරීමට අවශ්‍ය ඉඩම හා ප්‍රතිපාදන ආදී පහසුකම් ලැබීම් මත ප්‍රමුඛතාවය අනුව එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. ඒ අනුව වැල්ලවත්ත අපජල පවිත්‍රාගාර ව්‍යාපෘතිය ද අනාගතයේදී ආරම්භ කිරීමට හැකිවේ.

07	රථවාහන නැවතුම්පළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් කුලී මුදල් අය කර ගැනීමේ දුර්වලතා පැවතීම	<u>විමර්ශනය කල දිනය - 2025.02.27</u> කාර්යාල සඳහා ලබා දුන් බිම් කොටස් ආර්ථික කටයුතු සඳහා යෙදවීම රජයේ දේපළ දැඩි ලෙස අවභාවිතා කිරීමක් බවත්, අදාළ මන්ත්‍රීවරුන්ගෙන් ඒ සඳහා අධිභාර අය කර ගත යුතු බවත් කාරක සභාව නිරීක්ෂණය කළේ ය. මෙම කරුණු සම්බන්ධයෙන් අදාළ තොරතුරු විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර, කාර්යාල සඳහා ලබා දුන් බිම් කොටස් ආර්ථික කටයුතු සඳහා යෙදවීම සිදු කරන ලද බවට හෙළි වන මන්ත්‍රීවරුන්ගෙන් ඒ සඳහා අධිභාර අයකර ගැනීමට කටයුතු කරන ලෙසට කාරක සභාව නිර්දේශ කළ අතර ප්‍ර.ග.නි / ග.නි. ඒ සඳහා එකඟ විය.	කොළඹ මහා නගර සභාවේ මන්ත්‍රීන් විසින් රථගාල් ස්ථාන අවභාවිතා කිරීමෙන් සභාවට වූ මූල්‍යමය පාඩුව ගණනය කිරීම සඳහා නිශ්චිත තොරතුරු නොමැති වීම හේතුවෙන් නාගරික කොමසාරිස් විසින් විගණන අධිකාරී, රජයේ විගණන අංශය වෙත යොමු කරන ලද අංක ME/TDRS/AR/COPA-2 හා 2025.10.03 දිනැති ලිපිය මඟින් රථගාල් ස්ථාන අවභාවිතා කළ මන්ත්‍රීවරුන්ගේ නම සහ අදාළ ස්ථාන වෝහාරික විගණනයේදී නිශ්චිතව හඳුනාගෙන ඇත්නම් ඒ සම්බන්ධයෙන් තොරතුරු කොළඹ මහා නගර සභාව වෙත ලබා දෙන මෙන් ඉල්ලීමක් සිදුකර ඇත (ඇමුණුම 23).
08	බස් නැවතුම් දැන්වීම් පුවරු ව්‍යාපෘතිය, ග්‍රැන්ට් සංඥා පුවරු සහ **Smart Street Light** යන ව්‍යාපෘති සම්බන්ධ ගැටලු	<u>විමර්ශනය කල දිනය - 2025.02.07</u> 1. කාරක සභාවේදී අනාවරණය වූ ව්‍යාජ අත්සන් යෙදූ ඊපාර මේල් පණිවිඩයක් මගින් ව්‍යා-කටයුත්තක් සඳහා අනුමැතියක් ලබාදී තිබීම (කුඨ ලේඛන සකස් කිරීම) සහ විදි ලාම්පුවල පාලනය බාහිර පාර්ශවයක් අත පැවතීම මත ජාතික ආරක්ෂාව පිළිබඳ ගැටලු මතුවීම යන කරුණු සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමේ කටයුතු 2025.02.28 දින සිදු කරන ලෙසත් 2. නාගරික භාණ්ඩාගාරික ස්ථාන මාරුවීම් යාමේදී	**නීර්දේශ අනුව ගෙන ඇති ක්‍රියාමාර්ග** 1. දිනැතිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව 07 හා 2025.03.06 වෙත පැමිණිලි ඉදිරිපත් කර ඇති බව කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ අංක ME/ADM/COPA/2025 හා 2025.03.15 දිනැති ලිපියෙන් වාර්තා කර ඇත. 2. කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ අංක SEC/ SC12 (RD 09)/PF-Per. App.- MT හා දිනැති 2025.05.14 දින ස්ථාන මාරු වී යන නාගරික භාණ්ඩාගාරික සතුව පවතින වංචාවලට අදාළ තොරතුරු, මූල්‍ය ලේඛන සියල්ල ලිඛිතව හා

		ඒම නිලධාරිණිය සතුව පවතින මූල්‍ය වංචාවලට අදාළ තොරතුරු ඇතුළත් ලේඛන සියල්ල ලිඛිතව හා ආරක්ෂිතව සුදුසු නිලධාරියතු වෙත භාර දෙන ලෙසත් 3. මෙම ගැටළුව සම්බන්ධව විගණන වාර්තා ලුහුඬු සටහනෙහි සඳහන් කරුණු පිළිබඳව වර්තමාන තත්වය රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත වාර්තා කරන ලෙසත් කාරක සභාව නිර්දේශ කළ අතර නාගරික කොමසාරිස් ඒ සඳහා එකඟ විය **<u>විමර්ශනය කල දිනය - 2025.10.08</u>** 1. දින 2025.02.27පැවති රජයේ ගිණුම් පිළිඳබ කාරක සභා රැස්වීමේදී කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස නිර්දේශ කරන ලද , ඒදින සාකච්ජා කරන ලද විගණන වාර්තා කෙටුම්පතේ මෙම ගැටළුව සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව වර්තමාන තත්වය ඇතුළත් වාර්තාව සහ Smart Street Light ව්‍යාපෘතිය සම්බන්ධ නව ව්‍යාපෘති යෝජනාවේ මූල්‍යමය ශක්‍යතාවය පිළිඳබ ඇගයීම සඳහා පත්කර ඇති කමිටුවේ වාර්තාව , මාසයක් 2025.11.08 දිනට පෙර කාරක සභාව වෙත ගෙන යාමට එකඟ විය.	ආරක්ෂිතව ප්‍රධාන ගණකාධිකාරී (ප්‍රසම්පාදන) වෙත භාර දෙන ලෙස දන්වා ඇත. **3. 2025.05.16 ලිපියෙන් වර්තමාන ප්‍රගතිය** අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කළ පැමිණිල්ල අනුව 2026.03.05 දින කොළඹ මහා නගර සභාවේ රථවාහන, නිර්මාණ හා මාර්ග ආරක්ෂණ අංශයේ ලිපි ලේඛණ පරීක්ෂා කිරීමක් සිදු කරන ලදී. 2025.02.27 දින සාකච්ඡාවට පාදක වූ අංක SIF/A/ABDF/2022/04 හා දිනැති වෝහාරික විගණන වාර්තාවට අදාළව වර්තමාන තත්ත්වය කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ අංක MT/ADM/COPA/2025/02 හා 2025.11.06 දිනැති ලිපියෙන් වාර්තා කර ඇති අතර, ප්‍රශ්නගත සමාගම විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති සංශෝධිත නව යෝජනාවේ මූල්‍යමය ශක්‍යතාවය පිළිබඳ ඇගයීම සඳහා පත් කරන ලද කමිටුව විසින් එම යෝජනාව කොළඹ මහා නගර සභාවට මූල්‍යමය වශයෙන් අවාසිදායක බව නිර්දේශ කර ඇති බැවින් ඉදිරි තීරණ ගැනීම සඳහා නගරාධිපතිතුමිය මහින් සභාව වෙත යොමු කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. අදාල කමිටු වාර්තාවේ පිටපතක් ද කාරක සභාව වෙත යොමු කර ඇත. M/s Richarson Technologies (Pvt) Ltd. ආයතනය විසින් ඉහත ව්‍යාපෘතියට අදාලව ඉදිරිපත් කර ඇති සංශෝධිත සැලැස්ම පිළිබඳව ඇගයීම් කිරීම් සඳහා පත් කල කමිටුව විසින් එම යෝජනාව මූල්‍යමය වශයෙන් සභාවට අවාසිදායක වන බැවින් නිර්දේශ කර නොමැත. එසේම මෙම කමිටුව විසින් මතුකර ඇති නෛතික ප්‍රතිවිපාක හා අවධානම් තක්සේරුව පිළිබඳ නිර්දේශ සඳහා පත කළ කමිටුව මගින්ද සඳහන් කර ඇත්තේ සභාවේ අනුමැතිය මත මුල් කමිටු නිර්දේශය M/s. Richarson Technologies (Pvt) Ltd. ආයතනය වෙත යොමු කළ යුතු බවකි.(ඇමුණුම 24).

			ඒ අනුව ඉහත කරුණු සැලකිල්ලට ගෙන මූල්‍යමය පාඩුවක් සහාවට සිදුවන්නේ නම්, එම කමිටු නිර්දේශය පිළිගෙන M/s Richarson Technologies (Pvt) Ltd. ආයතනය විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ එම ආයතනයට දැනුම් දීමට කටයුතු කිරීම සඳහා මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවෙන් නිර්දේශය සහ 2026.04.09 දිනැතිව කෙටුම් පත් අංක 320 යටතේ මහා සභාවෙන් සම්මත කර ඇත (ඇමුණුම 25). එකී සභා තීරණයට අනුව M/s Richarson Technologies (Pvt) Ltd. ආයතනය විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ එම ආයතනයට දැනුම් දීම ME/ME/ML/70/2017 අංක හා 2026.05.15 දිනැති ලිපිය මඟින් සිදු කර ඇත (ඇමුණුම 26).
09	**කාර්යය මණ්ඩල** **පුරප්පාඩු**	<u>විමර්ශනය කල දිනය - 2025.10.08</u> ජේෂ්ඨ මට්ටමේ නිලධාරීන් ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත බඳවා ගැනීම් සිදු කර ඇත්නම්, ඊට අදාල කාල වකවානු, බඳවාගත් ආකාරය හා ඒ සඳහා අනුමැතිය ලබාගත් ආකාරය පිළිඳබව කාරක සභාව වෙත වාර්තා කිරීමට කාරක සභාව කල නිර්දේශයට ග.නි. ඒකඟ විය.	ශ්‍රම මිලදී ගැනීමේ පදනම යනුවෙන් සේවා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සේවයේ යෙදවීම සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අංක LGD/21/PRO/පොදු හා 2022.12.30 දිනැති ලිපිය යටතේ අනුමැතිය ලබා දී ඇත. මෙම ක්‍රමය සඳහා පාදක වී ඇත්තේ එතෙක් පැවති ව්‍යාපෘති පදනමින් සේවකයින් බඳවාගෙන ක්‍රියාත්මක වීමේදී සිදු වූ ප්‍රමාදයන් වැළැක්වීම සඳහා වේ. එම අනුමැතිය මගින් ස්ථිර කාර්ය මණ්ඩලය මගින් ඉටු කරගත නොහැකි සේවා අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමට සභාවේ මූල්‍ය තත්ත්වය මත ශ්‍රම මිලදිගැනීමේ පදනමින් ඉටු කිරීමට අවසර ලබා දී ඇත. කොළඹ නගර සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලය, අනුමත කාර්ය මණ්ඩලයෙන් 50% පමණ මට්ටමින් අඩුවීමත් නව බඳවා ගැනීම් ඉතා සීමිත කර ඇතත්, සීඝ්‍රයෙන් දියුණු වන නගරයක අවශ්‍යතා දිනෙන් දින වැඩිවීමත් මත, ලබාදිය යුතු සේවා අඛණ්ඩව පවත්වා ගැනීමට ද, ඒවාගේ ගුණාත්මකභාවය රඳවා ගැනීමටද, අලුතින් ඇතිවන සේවා අවශ්‍යතා ඉටුකරදීම සඳහාද, මෙලෙස ස්ථිර කාර්ය මණ්ඩලය නිහවීම මත විකල්ප සේවකයින් යොදවා ගත යුතුව ඇත. ඒ අනුව ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත විවිධ ශ්‍රේණි සඳහා සුදුසුකම් ලත් අය යොදවා ඇත. එනමුත් එම සියලු දෙනාගේම වැඩ කටයුතු ස්ථිර සේවක මණ්ඩලයේ අධීක්ෂණය යටතේ සිදුකරන බවට වග වී ඇත. (ඇමුණුම 27)

ඒ. ඩී. එස්. රෝහණ (රා.ඉ.)

නාගරික කොමසාරිස්

කොළඹ මහා නගර සභාව

ඒ. ඩී. එස්. රෝහණ
නාගරික කොමසාරිස් (රා.ඉ.)
කොළඹ මහා නගර සභාව

දුරකථන අංකය -0112699316
ෆැක්ස් අංකය - 0112699316
විද්‍යුත් ලිපිනය - ma175@colombo.mc.gov.lk

2024.12.31 දිනට හිඟ වරිපනම් බදු අයකර ගැනීමේ/දේපළ සමීක්ෂණය කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම - 2025

	පුළුල් ක්‍රියාකාරකම්	ඉලක්කය		කාලය	නිමයුම	ප්‍රධාන වගකීම
		දේපල සංඛ්‍යාව	හිඟය රුපියල් මිලියන			
01	සියළුම හිඟ සහිත දේපළ හඳුනාගැනීමට Demand Notices යැවීම.	79 980	3945	2025/03/15-2024/04/10	Demand Notice සියළුම හිඟ දේපළ වලට බෙදාහැරීම.	නාගරික කොමසාරිස් නාගරික භාණ්ඩාගාරික නාගරික තක්සේරුකරු
01.01 1.1.1	රජයේ දේපළ 5945 රජයේ අමාත්‍යාංශ හා දේපාර්තමේන්තු වල අය කරයුතු වරිපනම් බදු පිළිබඳ විස්තර ඇතුලත් ලිපිය සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට යැවීම.	670	240	2025/03/15-2024/04/10	සියළුම අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වලට ලිපි යැවීම (හිඟයෙන් 10% අය කිරීම.)	නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික ගණකාධිකාරි (වරිපනම්)
1.1.2.	සියළුම අර්ථ රාජ්‍ය ආයතන වලින් අයකර යුතු වරිපනම් බදු පිළිබඳ දැන්වීම් ලිපි යැවීම.	5275	919	2025/03/15-2024/04/10	ලිපි මඟින් දැන්වීම් (හිඟයෙන් 10% අය කිරීම)	නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික ගණකාධිකාරි (වරිපනම්)
1.2.1	පෞද්ගලික දේපළ හිමියන් වෙත 2024/12/31 දිනටහිගය දන්වමින් SMS මඟින් හා E-mail මඟින් දැන්වීම.	79 980	3945	2025/03/15-2025/03/21	දේපළ හිමියන් 79980ක් දැනුවත් කිරීම.(හිඟයෙන් 5% අයකිරීම,)	නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (තොරතුරු) නාගරික තක්සේරුකරු ගණාධිකාරි (වරිපනම්)
1.2.1	රුපියල් 100 000 වැඩි හිඟ සහිත දේපලවලට Demand Notices ප්‍රධාන ආදායම් පරීක්ෂකවරු මඟින් බෙදාහැරීම.	6816	1899.3	2025/03/15-2025/04/10	හිඟයෙන් 5% අයකිරීම,	නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණාධිකාරි (වරිපනම්) ප්‍රධාන ආදායම් පරීක්ෂණක ආදායම් පරීක්ෂක 12

සත්‍ය පිටපතක් බව පහතින් සඳහන් කරමි.

ප.එම්.එන්.ආර්. බණ්ඩාර
නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්)
නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුව
මහනුවර මහා නගර සභාව
කොළඹ 07

2024.12.31 දිනට හිඟ වරිපනම් බදු අයකර ගැනීමේ/දේපළ සමීක්ෂණය කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම - 2025

1.2.2.	රුපියල් ලක්ෂයට වඩා අඩු දේපළ සඳහා හිඟ බදු එකතු කරන ලබන නිළධාරීන් මඟින් Demand Notice බෙදාහැරීම.	73164	2045.7	2025/03/15-2025/04/10	හිඟයෙන් 4% අයකිරීම	නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණකාධිකාරි (වරිපනම්) හිඟ බදු එකතුකරනු ලබන නිළධාරීන් 9
1.3	Demand Notices බෙදාහැරීමට නොහැකිවූ දේපල එක් එක් ආදායම් පරීක්ෂ කොට්ඨාශ හා මාවත් අනුව හඳුනාගැනීම.	4300	233	2025/04/20-2025/04/30	හිඟ සහිත දේපළ වලින් 5% ක් පමණ භෞතික නොමැති දේපළ ලෙස හඳුනාගනීම.	නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (තොරතුරු) ගණකාධිකාරි(වරිපනම්)
1.3.1.	හඳුනාගන්නා ලද හිඟ සහිත දේපළ නොමැති දේපළ තක්සේරු අත්හිටුවීම.	4300	500	2025/05/01-2025/05/07	හිඟ සහිත දේපළ වලින් 5% ක් පමණ භෞතික නොමැති දේපල හඳුනාගනීම.	නාගරික කොමසාරිස් නාගරික භාණ්ඩාගාරික නාගරික තක්සේරුකරු
1.3.2	අත්හිටවූ දේපළ වලින් අයවීමට ඇති හිගයක් පොත්වලින් ඉවත් කිරීම.	4300	500	2025/05/07-2025/06/30	හිඟ සහිත දේපළ වලින් 5% ක් පමණ භෞතික නොමැති දේපල හඳුනාගැනීම.	නාගරික කොමසාරිස් නාගරික භාණ්ඩාගාරික නාගරික තක්සේරුකරු මූල්‍ය කළමනාකරණ කමිටුව
1.4	දේපළ තහනම් දැන්වීම් බෙදාහැරීම. (SEIZURE NOTICE) (මුළු දේපළ)	71980	3550	2025/04/01-2025/04/30	හිඟයෙන් 25%ක් අයකරගැනීම.	නාගරික කොමසාරිස් නාගරික භාණ්ඩාගාරික නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණකාධිකාරි (වරිපනම්) ප්‍රධාන ආදායම් පරීක්ෂණ ආදායම් පරීක්ෂක/දේපළ තහනම් නිළධාරි
1.4.1	රුපියල් ලක්ෂයට වැඩි හිගය සහිත දේපළ සඳහා දේපළ තහනම් දැන්වීම් බෙදාහැරීම. (SEIZURE NOTICE)	6135	1520	2025/04/01-2025/04/30	හිඟයෙන් 25%ක් අයකරගැනීම.	නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණකාධිකාරි (වරිපනම්) ප්‍රධාන ආදායම් පරීක්ෂණ

ඩී.එම්.එන්.ආර්. බණ්ඩාර
නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්)
නාගරික භාණ්ඩාගාරය දේපළ
කොළඹ මහා නගර සභාව
කොළඹ 07

2024.12.31 දිනට හිඟ වරිපනම් බදු අයකර ගැනීමේ/දේපළ සමීක්ෂණය කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම - 2025

						ආදායම් පරීක්ෂක
1.4.2	රුපියල් ලක්ෂයට වඩා අඩු හිඟ සහිත දේපළ තහනම් දැන්වීම. (SEIZURE NOTICE)	65 845	2030	2025/04/01-2025/04/30	හිඟයෙන් 25%ක් අය කරගැනීම	නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණකාධිකාරි (වරිපනම්) හිඟ බදු එකතු කරන නිළධාරි
1.5	තවදුරටත් හිඟ වරිපනම් නොගෙවන දේපල හිමිකරුවන් වෙත රතු නිවේදනය යැවීම. (Red Notice) (මුළු දේපළ)	57584	2761	2025/05/01-2025/05/15	දේපළ 57584 රතුනිවේදන යැවීම හා හිඟයෙන් 20% අයකිරීම.	නාගරික කොමසාරිස් නාගරික භාණ්ඩාගාරික නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණකාධිකාරි(වරිපනම්)
1.5.1	රුපියල් ලක්ෂයට වැඩි හිඟ සහිත දේපල සඳහා රතු නිවේදන යැවීම. (Red Notice)	4908	1330	2025/05/01-2025/05/15	දේපළ 4908 කට රතු නිවේදන යැවීම. හා හිඟයෙන් 20% අයකිරීම.	නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණකාධිකාරි(වරිපනම්) ප්‍රධාන ආදායම් පරීක්ෂණ ආදායම් පරීක්ෂක
1.5.2	රුපියල් ලක්ෂයට අඩු හිඟ සහිත දේපළ සඳහා රතු නිවේදන යැවීම. (Red Notice)	52676	11131	2025/05/01-2025/05/15	දේපළ 52676 කට රතු නිවේදන යැවීම හා හිඟයෙන් 20% අය කර ගැනීම.	නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණකාධිකාරි(වරිපනම්) හිඟ දේපළ තක්සේරු නිළධාරි 9
1.6	දේපළ අත්පත් කර ගැනීමේ නිවේදන/රතු නිවේදන යැවීමෙන් පසුව 2025/06/30 දිනට 2024/12/31යෙහි හිඟයෙන්	39990	1972	2025/05/15-2025/05/30	දේපළ පවතින චංචල හා නිශ්චල දේපළ තහනම් කිරීමට ප්‍රමුඛත්ව ලේඛණ සකස් කිරීම.	නාගරික කොමසාරිස් නාගරික භාණ්ඩාගාරික නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්)

සත්‍ය පිටපතක් බව සහතික කරමි.

ඊ.එම්.එන්.ආර්. බණ්ඩාර
නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම)
නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුව
කොළඹ මහා නගර සභාව
කොළඹ 07

2024.12.31 දිනට හිඟ වරිපනම් බදු අයකර ගැනීමේ/දේපළ සමීක්ෂණය කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම - 2025

	තවදුරටත් ගෙවීමට හිඟව පවතින දේපළ සඳහා ගැනීම.					ගණකාධිකාරි(වරිපනම්)
2	දේපළ තහනම් කිරීම සඳහා පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීම හා ගැසට් පත්‍ර ප්‍රකාශ කිරීම.	39990	1972	2025/05/15-2025/05/30	හිඟයෙන් 20%ක් අය කරගැනීම.	නාගරික කොමසාරිස් නාගරික භාණ්ඩාගාරික නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණකාධිකාරි(වරිපනම්)
2.1	රුපියල් ලක්ෂ 10කට වැඩි හිඟ සහිත දේපළ තහනම් කිරීමට ප්‍රසිද්ධ පුවත්පත් වල ප්‍රසිද්ධ කිරීම.	180	549	2025/06/01-2025/06/15	හිඟයෙන් 20% අයකර ගැනීම හා ඉතිරිය සනාථ කිරීම.	නාගරික කොමසාරිස් නාගරික භාණ්ඩාගාරික නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණකාධිකාරි(වරිපනම්)
2.2	රුපියල් ලක්ෂ 10 ට වැඩි හිඟ සහිත දේපළ අත්පත් කර ගැනීමට නිවේදනය කිරීම.ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කිරීම.	140	500	2025/07/15-2025/08/15	හිඟයෙන් 20% ක් අය කරගැනීම.	නාගරික භාණ්ඩාගාරික නාගරික කොමසාරිස් නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණකාධිකාරි(වරිපනම්)
2.3	රුපියල් ලක්ෂ 10ට වැඩි හිඟ සහිත දේපළ වල චංචල නිශ්චල දේපළ අත්පත් කරගැනීම.	110	400	2025/08/15-2025/09/30	හිඟයෙන් 20% ක් අය කරගැනීම.	නාගරික කොමසාරිස් නාගරික භාණ්ඩාගාරික නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණකාධිකාරි(වරිපනම්)
2.4	රුපියල් ලක්ෂ 10 සහ ලක්ෂ 05 අතර හිඟ සහිත දේපල අත්පත් කරගැනීමට ප්‍රසිද්ධ පුවත්පත් වල දැන්වීම ප්‍රසිද්ධ කිරීම.	337	228	2025/05/15-2025/06/15	හිඟයෙන් 20% ක් අය කරගැනීම.	නාගරික කොමසාරිස් නාගරික භාණ්ඩාගාරික නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්)

2024.12.31 දිනට හිඟ වරිපනම් බදු අයකර ගැනීමේ/දේපළ සමීක්ෂණය කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම - 2025

						ගණකාධිකාරි(වරිපනම්)
2.5	රුපියල් ලක්ෂ 10 සහ ලක්ෂ 05 අතර හිඟ සහිත දේපල ගැස්ට් කිරීම හා දේපළ අත්පත් කරගැනීමේ කටයුතු	270	182	2025/06/01-2025/09/30	හිඟයෙන් 20% ක් අය කරගැනීම	නාගරික කොමසාරිස් නාගරික භාණ්ඩාගාරික නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණකාධිකාරි(වරිපනම්)
2.6	රුපියල් ලක්ෂ 5 සහ රුපියල් ලක්ෂය අතර හිඟ සහිත දේපළ අත්පත් කරගැනීම සඳහා ප්‍රසිද්ධ පුවත්පත් වල දැන්වීම් ප්‍රසිද්ධ කිරීම	2771	561	2025/06/01-2025/06/30	හිඟයෙන් 20% ක් අය කරගැනීම	නාගරික කොමසාරිස් නාගරික භාණ්ඩාගාරික නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණකාධිකාරි(වරිපනම්)
2.7	රුපියල් ල්කෂ 5 සහ රුපියල් ලක්ෂය අතර දේපළ අත්පත් කරගැනීමට ගැස්ට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීම හා දේපල අත්පත් කරගැනීම.	2200	440	2025/06/15-2025/09/30	හිඟයෙන් 20% ක් අය කරගැනීම.	නාගරික කොමසාරිස් නාගරික භාණ්ඩාගාරික නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණකාධිකාරි(වරිපනම්)
2.8	රුපියල් ලක්ෂයට අඩු හිඟ වරිපනම් සහිත දේපළ තහනම් කිරීම් සඳහා ප්‍රසිද්ධ පුවත්පත් වලට ප්‍රසිද්ධ කිරීම.	16168	738	2025/06/15-2025/06/30	හිඟයෙන් 40% ක් අය කරගැනීම.	නාගරික කොමසාරිස් නාගරික භාණ්ඩාගාරික නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණකාධිකාරි(වරිපනම්)
2.9	රුපියල් ලක්ෂයට අඩු හිඟ වරිපනම් සහිත දේපළ ගැසට් කිරීම.	9000	400	2025/07/01-2025/09/30	හිඟයෙන් 20% ක් අය කරගැනීම.	නාගරික කොමසාරිස් නාගරික භාණ්ඩාගාරික නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණකාධිකාරි(වරිපනම්)

සත්‍ය පිටපතක් බව සහතික කරමි.

ඒ.එම්.එන්.ආර්. බණ්ඩාර
නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්)
නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුව
කොළඹ මහ නගර සභාව
කොළඹ 07

2024.12.31 දිනට හිඟ වරිපනම් බදු අයකර ගැනීමේ/දේපළ සමීක්ෂණය කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම - 2025

3	දේපළ අත්පත් කරගැනීම. හිඟ තිබෙන දේපළ අතපත් කර ගැනීමේ නිවේදන.රතු නිවේදන,ප්‍රසිද්ධ පුවත්පත් වල ප්‍රසිද්ධ කිරීමෙන් පසුව හිඟ පවතින දේපල ප්‍රසිද්ධ වෙන්දේසියක් මඟින් අත්පත් කරගැනීම.	9000	7000	2025/10/01-2025/12/31	හිඟයෙන් 70% ක් අය කරගැනීම	නාගරික කොමසාරිස් නාගරික භාණ්ඩාගාරික නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණකාධිකාරි(වරිපනම්) ආදායම් පරීක්ෂක දේපළ හිඟ මත ගනු ලබන නිලධාරි
4	වෙන්දේසි අවසන් කර දේපළ සභාවට පවරාගත් ස්ථානීය පරීක්ෂණයක් කර සභාව නතුකර ගැනීම.	270	210	2026/01/01-2026/03/31	ඔප්පුවක් මඟින් දේපළ සභාව සතු කර ගැනීම.	නාගරික කොමසාරිස් නාගරික භාණ්ඩාගාරික නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණකාධිකාරි(වරිපනම්)
5	වරිපනම් එක රාශි කිරීම සඳහා ජංගම එකරාශි කිරීමේ සේවාවක් ආරම්භ කිරීම.	71980	3550	2025/04/21-2025/09/30	හිඟයෙන් 70% ක් අය කරගැනීම.	නාගරික කොමසාරිස් නාගරික භාණ්ඩාගාරික නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණකාධිකාරි(වරිපනම්) AO (ආදායම්) CC (වරිපනම්)
5.1	වරිපනම් බදු කළට වෙලාවට ගෙවීමේ වැදගත් කම පිලිබඳව බදුගෙවන ජවතාව් දැනුවත් කිරීමට සමාජ මාධ්‍යය හා පුවත්පත් දැන්වීම් ප්‍රසිද්ධ කිරීම හා කොළඹ නගර සභා බල ප්‍රදේශය තුල බැනර් ප්‍රදර්ශනය කිරීම.	180000	4660	2025/04/21-2025/12/31	වාර්ෂික හා හිඟ වරිපනම් වලින් 10% ඒකරාශි කිරීම.	නාගරික කොමසාරිස් නාගරික භාණ්ඩාගාරික නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණකාධිකාරි(වරිපනම්) AO (ආදායම්) CC (වරිපනම්)

2024.12.31 දිනට හිඟ වරිපනම් බදු අයකර ගැනීමේ/දේපළ සමීක්ෂණය කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම - 2025

5.2	වරිපනම් බදු ගෙවනු ලබන බදුකරුවන්ගේ පවතින ගැටළු විසඳීමට සහියේ සඳුදා හා බදාදා දින වෙන්කර දීම හා භෞතික දේපල පරීක්ෂා කර ගැටළු විසඳීම.	500	400	2025/04/21-2025/12/31	වාර්ෂික හා හිඟ වරිපනම් වලින් 10% ඒකරාශි කිරීම.	නාගරික කොමසාරිස් නාගරික භාණ්ඩාගාරික නා.නාක්සේරුකරු නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණකාධිකාරි(වරිපනම්)
5.3	බැංකු මඟින් වරිපනම් බදුගෙවීම Online මඟින් වරිපනම් බදු ගෙවීම තවදුරටත් සරල කිරීම.	60000	1000	2025/04/21-2025/12/31	වර්තන හා හිඟයෙන් 10% අයකිරීම.	නාගරික කොමසාරිස් නාගරික භාණ්ඩාගාරික නාතක්සේරුකරු නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණකාධිකාරි(වරිපනම්)
6	රාජ්‍ය දේපළ හිඟයන් අයකර ගැනීම හෝ කපා හැරීම.	5945	1309	2025/03/15-2025/09/30	හිඟයෙන් 40% ක් අය කරගැනීම.	නාගරික කොමසාරිස් නාගරික භාණ්ඩාගාරික නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණකාධිකාරි(වරිපනම්)
6.1	අර්ධ රාජ්‍ය ආයතනවල හිඟය අය කරගැනීම ලක්ෂ 5ට අඩු ලක්ෂ 5ත් ලක්ෂ 10ත් අතර ලක්ෂ 10ට වැඩි (සාකච්ඡා මඟින්)	5173 167 185	173.5 125.2 620.7	2025/03/15 2025/09/30	හිඟයෙන් 40% ක් අය කරගැනීම.	නාගරික කොමසාරිස් නාගරික භාණ්ඩාගාරික නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණකාධිකාරි(වරිපනම්)
6.2	රාජ්‍ය දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ හිඟය අයකර ගැනීම.(සාකච්ඡා මඟින්)	420	390.1	2025/03/15 2025/09/30	හිඟයෙන් 40% ක් අය කරගැනීම.	නාගරික කොමසාරිස් නාගරික භාණ්ඩාගාරික නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) ගණකාධිකාරි(වරිපනම්)

සත්‍ය පිටපතක් බව සහතික කරමි.

ජ.එම්.එන්.ආර්. බණ්ඩාර
නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්)
නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුව
කොළඹ මහා නගර සභාව
කොළඹ 07

2024.06.30 දිනට නිකුත් කරන ලද වරෙන්තු බලපත්‍රයෙහි සඳහන් දේපළ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන විශ්ලේෂණ වාර්තාව හා ඉදිරි කියාමාර්ග සඳහා යොමුකරන ලද දේපළ පිළිබඳව වාර්තාව

කොට්ඨාශ අංකය	නාගරික කොට්ඨාශය	**2024.06.30** දිනට හිඟ මුදල රු **100,000** ට වැඩි වරෙන්තු බලපත්‍රයේ සඳහන්		සොයාගත නොහැකි බවට වාර්තා කර ඇති		දේපළ තහනමට ගැනීමේ නිවේදන භාර දෙන අවස්ථාව වන විට ගැටළු පවතින බවට		රජයේ දේපළ බවට වාර්තා කර ඇති		සත්දින නිවේදන නිකුත් කළ දේපළ		පවරා ගැනීම සඳහා නිර්දේශ කර ඉදිරි කටයුතු සඳහා යොමු කර ඇති දේපළ	
		දේපළ සංඛ්‍යාව	වටිනාකම	දේපළ සංඛ්‍යාව	වටිනාකම	දේපළ සංඛ්‍යාව	වටිනාකම	දේපළ සංඛ්‍යාව	වටිනාකම	දේපළ සංඛ්‍යාව	වටිනාකම	දේපළ සංඛ්‍යාව	වටිනාකම
1	මට්ටක්කුලිය	128	38,879,784.21	12	2,017,000.13	0	-	0	-	85	16,334,813.31	68	13,023,285.70
2	මෝදර	78	20,295,748.28	1	454,232.40	0	-	0	-	61	13,217,011.57	43	9,825,499.20
3	මහවත්ත	76	13,779,197.91	1	168,094.49	0	-	4	642,123.24	58	9,936,559.44	0	0
4	අලුත්මාවත	93	22,184,340.66	10	1,803,168.51	4	1,005,746.75	0	-	64	13,646,154.23	0	0
5	ලුණුපොකුණ	39	11,082,293.78	1	106,574.16	0	-	1	2,951,440.80	27	5,209,040.73	26	5,065,441.60
6	බිලියුමැන්ඩල්	88	25,934,091.56	3	926,768.39	0	-	4	1,883,820.62	42	8,376,912.62	24	5,686,817.84
7	කොටහේන නැගෙනහිර	57	15,436,476.45	2	326,800.94	1	486,948.00	0	-	40	9,916,595.61	38	9,514,201.31
8	කොටහේන බටහිර	55	13,026,323.97	3	529,213.20	0	-	0	-	38	7,181,369.31	32	6,143,108.87
9	කොච්චිකඩේ උතුර	124	24,364,185.77	6	1,287,375.20	0	-	0	-	77	11,095,718.33	48	8,491,442.58
10	ජින්තුපිටිය	49	10,661,475.68	-	-	-	-	-	-	33	5,964,342.57	18	3,866,448.14
11	මසන්ගස්විදිය	114	26,946,228.42	3	978,042.60	2	313,916.88	-	-	83	15,730,185.08	57	11,982,209.72
12	නිව්බසාර්	133	79,778,041.05	20	5,183,902.50	-	-	-	-	90	63,691,172.79	68	39,646,533.76
13	ග්‍රෑන්ඩ්පාස් උතුර	73	16,625,199.40	-	-	-	-	28	7,577,762.40	21	3,253,941.14	20	2,878,701.14
14	ග්‍රෑන්ඩ්පාස් දකුණ	112	43,646,349.21	11	3,579,507.96	-	-	27	7,448,508.14	63	28,936,898.07	54	13,657,877.79
15	මාලිගාවත්ත බටහිර	73	12,191,264.14	8	1,614,295.60	0	-	31	4,355,412.65	20	2,250,227.77	13	1,616,185.87
16	අළුත්කඩේ නැගෙනහිර	103	22,895,932.32	12	2,107,337.14	3	631,775.80	-	-	70	14,428,635.81	65	13,879,107.81
17	අළුත්කඩේ බටහිර	67	15,140,609.45	11	3,704,572.64	-	-		-	47	7,669,553.81	39	6,626,556.67
19	කොච්චිකඩේ දකුණ	193	46,758,735.93	3	1,120,344.12	1	1,839,283.80	60	11,151,611.41	89	19,551,171.57	82	17,599,797.05
20	කොටුව	840	541,940,316.13	83	22,551,587.04	146	91,523,539.47	221	266,976,556.21	203	57,234,234.57	94	23,400,314.38
